# 2.46 ශ්‍රී ලංකා ගුවන් විදුලි මාධ්‍යයේ හිමිකාරිත්වය හා ස්වාධීනත්වයේ ස්වරූපය පිළිබඳ අධ්‍යනයක්.

අයි.පී. නවගමුව
නො.196, රෝහල පාර, දෙහිවල.

## ABSTRACT

වසර 80 ක පමණ දිගු ඉතිහාසයක් පවතින ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි මාධ්‍යයය අග්නිදිග ආසියාවේ පැරණිතම ගුවන් විදුලි සේවාපද වේ. නමුත් වසර 60 ක පමණ කාළයක් කිසිදු තරගයකින් තොරව පැවත ආ ගුවන් විදුලියේ ගමන්මග 1990 දශකයෙන් පසුව වෙනස් වන්නට විය. ඒ ගුවන් විදුලි තරංගයන්හි අයිතිය පෞද්ගලික අංශයවෙත ලබා දීමත් සමගමය. වරෙක එය ඒකාකාරි මානසිකත්වයෙන් මිදි ස්වාධීන ගමන්මගක ගමන් කිරිමට මෙන්ම ගුවන් විදුලි මාධ්‍යයේ නිම්වලලු පුළුල්වීමක් ලෙසද හැදින්විය හැකිය.

දශක 6 ක් මුළුල්ලේ විවිධ කඩයිම් මායිම් පසුකරමින් ආ ගුවන් විදුලි මාධ්‍යයේ වටිනාකම බලයේ පවතින රජය දැන සිටි අතර එය තමන්ගේ පෞද්ගලික දේපලක් ලෙස භාවිත කළ අවස්ථාද නැත්තා නොවේ. එසේම ව්‍යාපාරික ප්‍රජාවද තමන්ට ලැබුණු මහගු අවස්ථාව පිළිබඳව මහා අවබොධයෙන් සිටි අතර ඔවුන් තම බලය තහවුරු කළ හැකි සුදුසුම මාධ්‍යය බවට ගුවන් විදුලිය පත්කර සිටියහ. ගුවන් විදුලි මාධ්‍යය පිළිබඳව සැලකිමේදී එහි නිදහස පිළිබඳව අපට අමතක කළ නොහැකිය.

ලෝකයේ මාධ්‍ය නිදහස පූර්ණව, අර්ධව භුක්ති විදන රටවල් පවතින අතර කිසිදු මාධ්‍ය නිදහසක් නොමැති රටවල්ද පවතී එසේම අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සැම පුරවැසියකුටම භාෂණය, ලේඛනය පිළිබඳ නිදහසක් පවතී. නමුත් එය රටට, ස්වෛරීත්වයට හානි නොපවත්වන ආකාරයට පැවතිය යුතුද වේ. ශ්‍රී ලංකාව අර්ධ මාධ්‍ය නිදහසක් පවතින රටක් ලෙස වර්ගකළ හැකි අතර අප නිදහස දෙස බැලිය යුත්තේ සමාජ වගකීමකින් යුතුවය. එනම්, මාධ්‍ය භාවිතය වදුරාට දැලිපිහිය ලැබුනාක් මෙන් භාවිත නොකර දැනට අධ්‍යාපනය හා තොරතුරු ලබාදෙන මෙවලමත් සේ භාවිත කළ යුතුය. වරෙක මෙම මාධ්‍ය භාවිතය රාජ්‍ය හෝ පෞද්ගලික හිමිකාරිත්වය මත විවිධ ස්වරූප ගන්නා අයුරු අප දැක ඇත.

මෙහිදී දශක 2 ක පමණ කාළයක් තුළ ගුවන් විදුලි මාධ්‍යයේ ඇතිවී ඇති තරගකාරිත්වය, පිළිබඳව එයින් මාධ්‍යයට සිදු වු වර්ධනය හො පරිහානිය පිළිබඳව සොයා බැලීමට මෙන්ම ගුවන් විදුලි සංඛ්‍යාත බෙදියාමේ විෂමතාව පිළිබඳව සොයා බැලීම අතිශය කාලොචිතය. එසේම ස්වාධීනත්වය මැනිම සඳහා නිර්ණායකයන් නොමැතිවීම මෙම පර්යේෂණයේදී මුහුණපෑ හැකි ප්‍රබල අභියෝගයකි.

ශ්‍රී ලංකාව වැනි රටක ජනතාව දැනුවත් වන ආකාරයේ ඕනැම ප්‍රවෘත්තියක් පළ කිරිම සඳහා හැකියාව පවති. නමුත් ඒ හැම ප්‍රවෘත්තියක්ම වාරණය කිරිමට හැකියාවක් ද රජයට ඇත. විපක්ෂය සැමදාම මාධ්‍යය නිදහස, ස්වාධීනත්වය ගැන කථා කරයි. බලයේ පවතින ආණ්ඩුවට චෝදනා එල්ල කරයි. නමුත් බලයට පැමිණි පසු ඔවුන් ද කලින් ආණ්ඩු මෙන් තමන්ගේ ඒකාධිකාරියට උචිත අන්දමට මාධ්‍යය හසුරවයි. රාජ්‍යය බලපෑම පවතින තුරු ශ්‍රී ලංකාවේ මාධ්‍යය ස්වාධීනත්වය මායාවක් වේ.

මාධ්‍යය තුළින් දෙනු ලබන පණිවුඩය කෙරෙහි මාධ්‍යය හිමිකරුවන්ගේ පෞද්ගලික සංකල්ප බලපානු ලබනවා මෙන්ම ප්‍රවෘත්ති සංස්කරණය කෙරෙහිද ඔවුන් තම සිවිල් බලය පතුරවීම සඳහා මාධ්‍ය හිමිකාරිත්වය යොදාගෙන ඇත. කාමුකත්වය උද්දීපනය කරන පහත් රසයක් ඇති දෑ කෙරෙහි වගකීමකින් තොරව හඹා යැම සඳහා අද මාධ්‍යය වැඩි කාලයක් ගෙන ඇත. ජන මාධ්‍යය ඕපාදූප වලින් පිරී පවතින අතර, එය අහිංසක ජීවිත කෙරෙහිද බලපානු ලබයි. එසේම ප්‍රවෘත්ති ලෙස ලිංගිකත්වය, සාහසිකත්වය, හා පාරිභෝගික රුචිකත්වයට මුල් තැනක් ලබා දෙයි.

වෙළඳ දැන්වීම් භාවිතය, මුදල් ඉපයීම පමණක් පරමාර්ථය කරගෙන ඇති අතර හුදෙක් පොදු වටිනාකම්, අගයන් අවතක්සේරුවට පත්කර ඇති අවස්ථාවන් බොහෝය. සමස්ථයක් ලෙස ගත් කළ මාධ්‍යයක වගකීම වියයුත්තේ ජනතාවගේ සුභසිද්ධින් සඳහා භාවිතා කළ හැකි මෙවලමක් වශයෙන් එනම් අධ්‍යාපනය තොරතුරු, විනෝදාස්වාදය ලබා දීම සඳහා මුලිකවීම වේ.

මෙහිදි බැසගත හැකි නිගමනය වන්නේ අද වන විට ශ්‍රී ලංකා ගුවන් විදුලි මාධ්‍යයේ ගමන්මග ප්‍රාග්ධනය, ව්‍යසායකත්වය හා බලය ඉදිරියේ වෙනස් වී ඇති ආකාරයවේ.

එසේම රාජ්‍ය අංශය කෙරෙහි රජය තම ආධිපත්‍ය පතුරවා ඇති අතර පෞද්ගලික අංශය, මාධ්‍ය හිමිකාරිත්වය තුළ පාරිභෝගීකරනයට ලක්වී ඇත.